සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 6 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 44 | S | I |
|---|---|---|---|---|

නැටුම් ( දේශීය) — කාලය පැය දෙකයි

නම / විභාග අංකය : ..............................................................................................................

**සැලකිය යුතුයි :-**
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 1 - 5 දක්වා දී ඇති ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

01. පරිසරයේ ගස්වැල් වල සුන්දරත්වයේ පැවැත්මට බලපාන සාධක කීපයකි.
(i) වර්ණ හා හැඩතල (ii) චලන හා කඳු (iii) කඳු හා පර්වත (iv) නාද හා පර්වත

02. චරිත නිරූපණයේ දී හා නර්තනයේ දී සිරුර ................. වශයෙන් බෙදේ.
(i) සමගුණ, දෙගුණ, සිව්ගුණ (ii) තාල, තිත්, තෙයි
(iii) අංග, ප්‍රත්‍යංග, උපාංග (iv) කඳ, හිස, පා

03. පැරණි ලී කෙළි නැටුමක නිදර්ශකයක් දැකිය හැකි වන්නේ,
(i) දළදා මාළිගාවේ ලී බාල්කයේය (ii) ඇම්බැක්කේ කතරගම දේවාලයේ ලී බාල්කයේ ය
(iii) දෙවුන්දර උපුල්වන් දේවාලයේ ගල් උලුවස්සේය (iv) කතරගම දේවාළ පෙරහැරේදීය

04. නර්තනයේ මූලික ඉරියව්ව හෙවත් අංගහාරය වන්නේ,
(i) දණ්ඩි කඳයි (ii) පාසරඹයි (iii) මංඩියයි (iv) හමාර පදයයි

05. උඩරට හනුමා වන්නම සඳහා උචිත තාල රූපය වන්නේ,
(i) මාත්‍රා 2 + 2 තනි තිතයි (ii) මාත්‍රා 3 + 3 තනි තිතයි
(iii) මාත්‍රා 2 + 3 දෙතිතයි (iv) මාත්‍රා 2 + 4 දෙතිතයි

- **අංක 6 - 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා හිස්තැන් සම්පූර්ණ කරන්න**

06. උඩරට නැටුමේ පා සරඹ ගණනින් ............................................ කි.

07. නර්තනයේ දී ගායනයේ දී හා වාදනයේ දී තාලය දැක්වීම සඳහා ............................................ භාවිතා කරයි.

08. දේශීය තාල පද්ධතියේ තනි තිතේ ප්‍රභේද ............................................ කි.

09. උඩරට නර්තනයේ ප්‍රධාන ශාන්ති කර්මය ............................................ යි.

10. මහනුවර යුගයේ දී ............................................ මඩුව ආශ්‍රිතව වන්නම් නිර්මාණය වී ඇත.

- **අංක 11 - 15 දක්වා දී ඇති A කොටසේ ප්‍රශ්න සඳහා B කොටසින් නිවැරදි පිළිතුර තෝරා යා කරන්න**

| | A | B |
|---|---|---|
| 11. | එන්. ඒ. සිරිබෝහාමි | සාරධර්මයකි |
| 12. | තෙල්මෙ නර්තනය | ද්‍රවිඩ ගැමි නැටුමකි |
| 13. | කෝලාට්ටම් | සිංහල ගැමි නැටුමකි |
| 14. | මෝල්ගස් නැටුම | සබරගමු නර්තන සම්ප්‍රදාය |
| 15. | ගුරු නමස්කාරය | පහතරට නර්තන සම්ප්‍රදාය |

- **අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්න වලට හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.**

16. "ඉරට ඔබිය ඉර මුදුනේ සිටියා" මෙය කුලු කවියක පද කොටසකි. (............)
17. පහතරට වන්නම් සිංදු වන්නම් නමින් හඳුන්වයි. (............)
18. තේවා හේවිසි සඳහා බටනලාව උපයෝගී කර ගනියි. (............)
19. "රෑ තරු බබලනවා" මෙය කැරොල් ගීත කොටසකි. (............)
20. ආගමික හා සමාජීය උත්සව වලදී විකල්ප වාද්‍ය භාණ්ඩ උපයෝගී කර ගනියි. (............)

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 6 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 44 S II |
|---|---|---|

**නැටුම් ( දේශීය)** කාලය පැය එකයි

★ තෝරා ගත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. පහත සඳහන් තිත් රූපය සහිත වගුවේ අදාල තාල සංඥා නිවැරදිව යොදන්න. (/ ^)

| | | | |
|---|---|---|---|
| 1 2 | 1 2 3 | 1 2 | 1 2 3 |

(ල. 02)

ii. එක පඳුරෙන් ලී සයක් කපාගෙන
මෙම කවි පදය මාත්‍රා 2 තාලයට ප්‍රස්ථාර කරන්න (ල. 04)

iii. හනුමා වන්නමේ එක් කවියක් ලියා දක්වන්න (ල. 04)

02. i. ඔබ උගත් ගැමි නැටුමක් නම් කර, ඊට අදාළ කවියක් ලියන්න (ල. 02)

ii. ගැමි නැටුමක විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න (ල. 04)

iii. කුලු නැටුම සඳහා භාවිතා කරන කුල්ලක් ඇඳ මෝස්තරයක් නිර්මාණය කරන්න (ල. 04)

03. i. ගුරු වන්දනා ගාථාව ලියන්න (ල. 02)

ii. ගුරුගෙදර හා බැඳි චාරිත්‍ර දෙකක් ලියන්න (ල. 04)

iii. නැටුම් පංති කාමරය තුල දී ඔබ උගත් සාරධර්ම දෙකක් ලියන්න (ල. 04)

04. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන කෙටි රචනාවක් ලියන්න.

i. සමන් දේවාල පෙරහැර
ii. තෛයිපොංගල් උත්සවය
iii. නත්තල් උත්සවය

(ල.10)

05. පහත සඳහන් වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| | | | |
|---|---|---|---|
| උඩරට | (1) ...................... | මහනුවර කෑගල්ල | වෙස් ඇඳුම් කට්ටලය |
| (2) ...................... | දෙවොල් බෙරය | (3) ...................... ...................... | තෙල්මේ ඇඳුම |
| සබරගමු | (4) ...................... | ඇහැලියගොඩ බලංගොඩ | (5) ...................... |

(ල. 2 x 5 = 10)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# නර්තනය - (ප්‍රායෝගික පරීක්ෂණය)

## 6 ශ්‍රේණිය

01. i. කැමති ජන ගායනයක්
    ii. නිර්දේශිත වෙනත් ගායනයක් (ල. 10)

02. දෙවන ගොඩ සරඹය කස්තිරම සමඟ නර්තනය කිරීම (ල. 10)

03. හනුමා වන්නමේ කවියක් ගයා තානම සහිත අලංකාර පදයක් නර්තනය කිරීම (ල. 10)

04. ගැමි නැටුමක එක් කවියකට අලංකාර පද දෙකක් නර්තනය කිරීම. (ල. 10)

05. කෙටි සිදුවීමක් ඇසුරින් සත්ව චරිත නිරූපණයක් ඉදිරිපත් කරන්න. (ල. 10)

මුළු ලකුණු(50)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# නර්තනය - පිළිතුරු පත්‍රය

## 6 ශ්‍රේණිය

I - පත්‍රය

01. 1 02. 3 03. 2 04. 3 05. 1

06. 12 කි
07. තාලම්පට
08. තුනකි
09. කොහොඹා කංකාරිය
10. කවිකාර
11. සබරගමු නර්තන සම්ප්‍රදාය
12. පහතරට නර්තන සම්ප්‍රදාය
13. ද්‍රවිඩ ගැමි නැටුමකි
14. සිංහල ගැමි නැටුමකි
15. සාරධර්මයකි

16. ✓
17. ✓
18. ✗
19. ✓
20. ✗

- II - කොටස සඳහා නිවැරදි පිළිතුර ලියා ඇත්නම් අදාළ ලකුණු දෙන්න